**ශීර්ෂය - 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශනය, වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ 3.1.1, 3.1.2 හා 3.1.3 වගුවල ඇතුළත් ආදායම් සංකේතවලට අදාල ආදායම් ගිණුමක්ද මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලදී. එම ගිණුම්වලින් හා සැසඳුම් ප්‍රකාශනවලින් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

### 1.2 ප්‍රධාන ගණන්දීමේ නිළධාරීගේ හා ගණන්දීමේ නිළධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත්කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිළධාරියා වන අතර, ආදායම් ගණන්දීමේ නිළධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටුකර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසැඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලසුම් කිරීම, රාජ්‍ය වියදම්, රාජ්‍ය ආදායම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනීම, නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල වීම් හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරීම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාල පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ වාර්තාව 2018 සැප්තැම්බර් 25 දින දෙපාර්තමේන්තුවේ මැනුම්පතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශන හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සිදුකරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.16 දක්වා ඡේදවල සඳහන්කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධානවලට අනුකූලව ප්‍රධාන ගණන්දීමේ නිළධාරී හා ගණන්දීමේ නිළධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය ඉටු කිරීමේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ සාරාංශ ගතකර පහත සඳහන් සටහනේ දක්වා ඇත.

| මුදල් රෙගුලාසි 128 ප්‍රකාරව ගණන්දීමේ නිළධාරිගේ ගිණුම් කටයුතුභාවය | | ගණන්දීමේ නිලධාරීගේ එම විධිවිධානයට අනුගත වී නොතිබීම | නිරීක්ෂණය ඇතුලත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසි** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණභාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබීම. | 1. ලේඛන හා පොත් පවත්වා නොතිබීම | 2.12 |
| | | 2. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 |
| | | 3. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |
| | | 4. මුදලට අගය විගණනයේදී අනාවරණය වූ අඩුපාඩු | 2.7 |
| 128(1)(ආ) | තම දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය හා ගිණුම්කරණය සඳහා සංවිධානය සාර්ථක බවට සහ අවශ්‍ය අවස්ථාවලදී රජයට ලැබිය යුතු ගාස්තු නිවැරදිව නිශ්චය කිරීමට ඒවා ක්‍රමානුකූලව ද සම්පූර්ණයෙන්ම ද අප්‍රමාදව ද එකතු කර ගැනීමට සහ ලැබෙන මුදල් ගිණුම්ගත කිරීමටද රජය වෙනුවෙන් වගකීම්වලට බැඳීම් සඳහා බලය දීමටද ඉටු කරන ලද සේවාවන් සැපයීම් අධීක්ෂණය හා පරීක්ෂා කිරීමට සහ එම රජයේ අරමුදලින් ඒ සඳහා අප්‍රමාදව හා නිවැරදිව ගෙවීම් කිරීමට ඉන් ප්‍රමාණවත් තරම් විධිවිධාන සලසා තිබීම. | 1. අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 |
| | | 2. ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීමේ අඩුපාඩු | 2.2.1 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව. | 1. ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම<br>2. අනුකූල නොවීම | 2.12<br>2.13 |
| 128(1)(ඇ) | ලැබීම්, ගෙවීම් හා නිකුත් කිරීම් සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර සෝදිසි ක්‍රමයක් පවත්වාගෙන යන බවට හා ඒ ක්‍රමයේ ක්‍රියාකාරීත්වය කලින් කල සෝදිසි කරන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ සදහන් අඩුපාඩු | 2.10 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින් වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව. | 1. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් කිරීමේ අඩුපාඩු<br>2. වත්කම් කළමනාකරණයේ අඩුපාඩු | 2.3 (ආ)<br>2.3 |
| 128(1)(උ) | රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම පිළිබඳ ප්‍රගතිය දැක්වෙන වාර්තා නිතිපතා ප්‍රධාන ගණන්දීමේ නිළධාරියාට යවන බව | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම සම්බන්ධයෙන් | 2.10 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනීමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිළධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරිමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාර්තා කරන බව. | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ හිඟ හිටි ණය ශේෂ අයකර ගැනීම | 2.10 |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාවය, විධිමත් බව හා අවංකභාවය යන කරුණු පිළිබඳව නිසි සැලකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව. | අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම | 2.1.2 |
| 128(1)(ග) | ඇප තැබීමට බැඳී සිටින නිළධාරීන් එවකට වලංගු නිතිය හා නියමයන් අනුව ඇප තබන බව | අදාල නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.16 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/ සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවල මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියමකර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිළධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිය යුතු නිළධාරීන්/සේවකයින් මත අධිභාර පනවනු ලබන බව | 1. පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම<br>2. අදාල නිලධාරින්ගෙන් ඇප ලබා ගැනීමේ අඩුපාඩු | 2.3 (ඇ)<br>2.16 |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්‍ෂණ
-----------------------------------------------

### 2.1 කාර්යසාධනය
-----------------

#### 2.1.1 සැලසුම් කිරීම
----------------

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුවේ අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගැනීම සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලැස්ම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් 13 කින් 08 ක් පමණක් ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර තිබුණු අතර, එක් එක් ක්‍රියාකාරකම් යටතේ වූ සංරචක සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල දක්වා නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුවේ ආදායම එකතු කිරීම සම්බන්ධ ඉලක්කයන් හා කාල වකවානු ක්‍රියාකාරි සැලැස්මේ ඇතුලත් කර නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු දෙපාර්තමේන්තුවේ සංවිධාන සටහනෙහි පළාත් කාර්යාල 09 ක සහකාර අධ්‍යක්ෂක (මුදල්) තනතුරු අධ්‍යක්ෂ (මුදල්) ගේ ඍජු අධීක්ෂණයට යටත්වන ලෙස පිළියෙල කිරීම වෙනුවට පලාත් සර්වේයර් ජනරාල්වරුන්ගේ ඍජු අධීක්ෂණයට යටත් වන ලෙස පිළියෙල කර තිබුණි.

#### 2.1.2 අපේක්ෂිත නිමැවුම් මට්ටම ලබා නොගැනීම
----------------------------------------------

වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ දක්වා තිබුණු පහත සඳහන් ක්‍රියාකාරකම්වලින් අපේක්ෂිත නිමැවුම් මට්ටම අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

(අ) ව්‍යවස්ථාපිත අවශ්‍යතාවයන් සඳහා ඉටු කල යුතු ඉංජිනේරුමය මැනුම් හෙක්ටයාර් 2000 න් හෙක්ටයාර් 1100 ක් පමණක් සමාලෝචිත වර්ෂයේ ඉටුකර තිබුණි.

(ආ) ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි මනින ලද ඉඩම්වල තොරතුරු පද්ධතියට ඇතුලත් කිරීම සඳහා මැනුම් යාවත්කාලීන කිරීමේ පත්‍ර 2880 ඉටු කිරීමට සැලසුම්කර තිබියදී ඉන් පත්‍ර 682 ක් පමණක් ඉටුකර තිබුණි.

(ඇ) දිගු කාලීන පාඨමාලා 03 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණද පවත්වා තිබුණේ එක් පාඨමාලාවක් පමණි.

(ඈ) වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව බිම් කැබලි වියමන (Parcel Fabric) 60,000 ක් ඉටු කිරීමට ඉලක්ක කර තිබුණද ඉටුකර තිබුණේ බිම් කැබලි 47,363 ක් පමණි.

## 2.2 ප්‍රසම්පාදන ක්‍රියාවලිය මඟින් සැපයුම් හා සේවා ලබා ගැනීම

## 2.2.1 ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.4 මාර්ගෝපදේශය පරිදි මිල සැඳහුම් ක්‍රමයේදී අවම මුද්‍ර තැබූ මිල ගණන් 05 ක් ලබා ගැනීමෙන් ප්‍රසම්පාදන තීරණය ගත යුතු වුවද, රු.මිලියන 8.9 ක වියදමින් යතාථ්‍ය මට්ටම් උපකරණ (Pricise Level) 06 ක් මිලදී ගැනීමේදී මිල ගණන් දෙකක් මත ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණු අතර, මෙම තීරණයට මූල්‍ය විශේෂඥයා අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) රු.මිලියන 1.9 ක වියදමින් ඇඟිලි සලකුණු යන්ත්‍ර 90 ක් මිලදී ගෙන තිබුණු අතර, 7.9.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුව නඩත්තු පිරිවැය සැළකිල්ලට නොගෙන ඇගයීම් කටයුතු සිදු කිරීම නිසා වර්ෂ 06 ක නඩත්තු පිරිවැය ඇතුළු අඩුමිල ඉදිරිපත් කල ලංසුකරු වෙනුවට වෙනත් ලංසුකරුවකු පිළිගෙන තිබීම නිසා රු.490,070 ක් වැඩිපුර දැරීමට සිදු වී තිබුණි.

(ඇ) Ink Tank වර්ගයේ A3 වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර 40 ක් මිලදී ගැනීමට ජාතික තරඟකාරි ලංසු ක්‍රමය යටතේ කැඳවූ මිල ගණන්, විවෘත කිරීමෙන් පසු අවලංගු කර තිබුණි. පසුව එම මිල සැඳහුම් ක්‍රමය යටතේ Ink Cartridge වර්ගයෙන් මුද්‍රණ යන්ත්‍ර මිලදී ගැනීමට දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණු අතර, එහිදී පළමුවර Ink Cartridge වර්ගයේ මුද්‍රණ යන්ත්‍ර සඳහා අඩුම මිල ඉදිරිපත් කල ලංසුකරුවකු මඟහැර මිල ගණන් කැඳවීම නිසා රු.මිලියන 1.22 ක වැඩි පිරිවැයක් දරා රු.මිලියන 2.34 කට මෙම යන්ත්‍ර මිලදී ගැනීමට සිදුව තිබුණි. එසේම රු.මිලියන 1.34 ක් ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රතිපාදන ඉක්මවා වැයකර තිබුණු අතර, ලංසු විවෘත කිරීමේ දිනය කල් දමා තිබුණ ද එම තොරතුරු ලංසුකරුවන්ට නිසියාකාරව සන්නිවේදනය කර නොතිබුණි.

(ඈ) රු. මිලියන 4.90 ක් වැයකර කාර්යාල ගෘහ භාණ්ඩ, කාර්යාල උපකරණ, පරිගණක උපාංග හා මැනුම් උපකරණ සහ ලිපිද්‍රව්‍ය මිලදී ගැනීමේදී ජාතික තරඟකාරි ලංසුක්‍රමය මත ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණු අතර, 3.2.2 (ඇ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි ලංසු කැඳවීමේ අවසන් දිනට පෙරාතුව වූ දිනය දක්වා ලංසු ලේඛන මිලදී ගැනීමට අවස්ථාව ලබාදිය යුතු වුවත්, ලංසු විවෘත කිරීමට සති දෙකකට පෙර දිනයක් ලංසු ලේඛන මිලදී ගැනීමේ අවසාන දිනය ලෙස දක්වා තිබුණි. එම නිසා තරඟකාරි ලංසුකරුවන්ට ඉදිරිපත් වීමට තිබුණු අවස්ථාව මඟහැරී තිබුණි.

(ඉ) නිලධාරීන් දෙදෙනෙකු විසින් ලබා ගත් අත්තිකාරම් උපයෝගී කරගෙන මිල සැඳහුම් ක්‍රමය යටතේ යකඩ බට ඇතුළු තවත් අයිතම කිහිපයක් මෙන්ම සපත්තු සහ වැහි කබා මිලදී ගැනීමට පිළිවෙලින් රු.127,150 ක් සහ රු.117,915 ක් වැයකර තිබුණි. අඩු මිල ගණන් ඉදිරිපත් කල තරඟකාරි ලංසුකරුවන් දෙනෙකුගේ මිල ගණන් වෙනස් කර ඇති බව නිරීක්ෂණය වූ අතර ඒ හේතුවෙන් වැඩි මිල ගණන් මත මිලදීගෙන ඇතැයි යන සැකය විගණනයෙන් බැහැර කළ නොහැකිය.

## 2.3 වත්කම් කළමනාකරණය

------------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

### (අ) වාහන උපයෝජනය

-----------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (i) වාහන නියමිත කාල වකවානු තුල සේවා නොකිරීම

--------------------------------------------------------

දෙපාර්තමේන්තුව සතු වාහන 55 ක් වර්ෂයකට අධික කාලයක් තුල සේවා කර නොතිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ අලුත්වැඩියා වියදම පසුගිය වර්ෂයට සාපේක්ෂව ඉහල යාමට මෙම තත්ත්වය හේතුවක් වී තිබුණි.

#### (ii) ඉන්ධන දහනය වීම් පරීක්ෂා කිරීම

---------------------------------------

2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය ප්‍රකාරව වාහන 104 ක ඉන්ධන දහනය වීම් සමාලෝචිත වර්ෂයේදී පරීක්ෂා කර නොතිබුණි.

### (ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

-----------------------------------------

සමාලෝචිත වර්ෂයේ සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු භාණ්ඩ ඌනතා 1459 ක් සහ අතිරික්තතා 1150 ක් සම්බන්ධයෙන් 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන මුදල් චක්‍රලේඛයේ 3.2.4 ඡේදය අනුව පරිදි කටයුතු කර නොතිබුණු අතර, සමීක්ෂණ වාර්තාව සමඟ ඉදිරිපත් කල යුතු පාවිච්චි කල නොහැකි භාණ්ඩ සම්බන්ධ අංක 47 දරන ආකෘතිය සකස්කර නොතිබුණි.

### (ඇ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

-------------------------------------------------------------

බිම්සවිය ප්‍රතිපාදන මඟින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිලි, ඉඩම් අමාත්‍යාංශයෙන් පවරා ගැනීමකින් තොරව පරිහරණය කරමින් තිබුණි.

## 2.4 අනාර්ථික ගනුදෙනු

-----------------------

දෙපාර්තමේන්තුව ත්‍රෛයි භාෂාවෙන්ම දත්ත පද්ධතියක් සැකසීම සඳහා රු.750,000 ක ගිවිසුම්ගත මුදලක් මත Textual Database of Land Parcel මෘදුකාංගය මිලදී ගැනීම සඳහා කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධ සමාගමකට පළමු කොටස් මුදල ලෙස රු.150,000 ක් ගෙවා තිබුණු අතර, පසුව මෘදුකාංගය ලබා නොගැනීමට තීරණය කිරීම නිසා ගෙවා ඇති මුදල නිශ්කාර්ය වී තිබුණි.

## 2.5 විසඳා නොතිබුණු විගණන ඡේද

-----------------------------------

දෙපාර්තමේන්තුවට අදාලව 2016 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ ඇතුලත්ව තිබුණු විගණන ඡේද වලින් පෙන්වා දුන් ඌනතාවයන් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව විසින් නිවැරදි කර නොතිබුණු ඡේද වලට යොමුව පහත දැක්වේ.

| විගණකාධිපති වාර්තාවලට යොමුව | යොමුගත විෂයය |
|---|---|
| **ඡේද අංකය** | |
| 3.1 | විදුලි උපකරණ ලේඛනය හා හානි ලේඛනය, නිසි පරිදි පවත්වා නොතිබීම |
| 3.4(අ) | රු.මිලියන 4.68 ක රජයේ නිළධාරින්ගේ ණය ශේෂ අයකර නොතිබීම. |
| 3.7 (ආ) | මිනින්දෝරුවරයකුට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව (Norms) 20 ක් වූ සම්මතය ඉහල නොදැමීම. |
| 3.11 (ආ) | මැනුම් ක්ෂේත්‍ර සහායකවරු 695 දෙනෙකු එම රාජකාරියට පරිබාහිර වූ කාර්යයන් ඉටු කිරිමට යොදවා තිබීම. |

## 2.6 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) මිනින්දෝරුවරයකුට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව වන (Norms) 20 ක් වූ සම්මතය වර්තමානයේ දියුණු තාක්ෂණික උපකරණ භාවිතයත් සමඟ ඉහල නොදමා ඒ මත සැලසුම් කර තිබුණි. ඒ හේතුවෙන් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මේ ක්‍රියාකාරකම් 19 ක භෞතික කාර්යසාධනය සියයට 28 සිට සියයට 227 දක්වා වර්ධනයක් පෙන්නුම් කර තිබුණද, නව තාක්ෂණික දියුණුව සලකා බලා මෙම අවම බිම් කැබලි සංඛ්‍යාව වැඩි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) වර්ෂ 01 සිට වර්ෂ 28 කට අධික කාල පරාසයක් තුල අවස්ථා 65 කදී සිදු වී ඇති රු.මිලියන 6.1 ක වාහන අනතුරු ඇතුළු අනෙකුත් අලාභයන් අයකර ගැනීම සඳහා හෝ පොත්වලින් කපා හැරීම සඳහා ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) අවශ්‍යතාවයන් නිසි ලෙස හඳුනා ගැනීමකින් තොරව 2015 වර්ෂයේදී රු.මිලියන 5.47 ක වියදමින් ඩ්‍රෝවින් කඩදාසි හා ලිතෝ කඩදාසි වර්ග කිහිපයක් මිලට ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.මිලියන 3.34 ක හෙවත් සියයට 61 ක තොග ඉතිරි වී තිබුණි.

(ඈ) දෙපාර්තමේන්තුවේ වාහන 13 ක් වර්ෂ 02 සිට වර්ෂ 06 දක්වා කාල පරාසයක් තුල නිෂ්ක්‍රීය හෝ ඌන උපයෝජිතව පැවතුණි. මෙම වාහන අපහරණය කර රජයට ආදායමක් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) රු.මිලියන 8.90 ක් වැයකර ලැප්ටොප් පරිගණක 93 ක් මිලදී ගැනීම සඳහා ලංසු ඇගයීමේදී වසර දෙකක අතිරේක වගකීම් කාලයක් සහ වඩා වැඩි වේගයක් ඇති පරිගණක මිලදී ගැනීමට නිර්දේශ කර නොතිබුණි. තවද, මැනුම් කටයුතු වලට අත්‍යාවශ්‍ය මෘදුකාංග පහසුකම් ලබාගෙනද නොතිබුණි.

(ඊ) රු.මිලියන 4.55 ක් වැයකර ඩෙස්ක්ටොප් පරිගණක 44 ක් මිලදී ගැනීමේදී බලශක්ති කාර්යක්ෂමතාවය (Power Efficiency ) හා පරිසර හිතකාමී (Eco Friendly) යන වාසි දායක තත්ත්වයන් සලකා බලා නොතිබුණු අතර, විෂය ප්‍රවීනයන් පිරිවිතර ලේඛන සකස් නොකිරීම නිසා විටින් විට පිරිවිතර සංශෝධනය කිරීමෙන් ප්‍රසම්පාදන කටයුතු සංකීර්ණ වී තිබුණි.

(උ) 2009 වර්ෂයේ සිට ප්‍රවර්තන වර්ෂය දක්වා දෙපාර්තමේන්තුවට උසාවිවලින් සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලැබුණු මැනුම් නියෝග 20091 ක් ඉටු කරදීමට කළමනාකරණය විසින් අවධානය යොමුකර නොතිබුණි.

## 2.7 මුදලට අගය විගණනය

-------------------------

(අ) අවකාශිත දත්ත සැකසීමේ ක්‍රියාවලිය සහ සියළුම සිතියම්කරණ කාර්යයන් සඳහා 2013 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා පිළිවෙලින් Arc GIS server මෘදුකාංගයක් සහ Arc GIS Stranded මෘදුකාංග 08 ක් මිලදී ගැනීම සඳහා රු.මිලියන 10.69 ක් වැයකර තිබුණු අතර, Arc GIS Server මෘදුකාංගයේ බලපත්‍ර අලුත් කිරීම සඳහා රු. මිලියන 2.43 ක් ද එම මෘදුකාංගය නඩත්තු කටයුතු සඳහා රු.මිලියන 2.30 ක් ද වශයෙන් එකතුව රු.මිලියන 15.42 ක වියදමක් දරා තිබුණු අතර, මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 අංක 08 දරන ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතන චක්‍රලේඛයේ 1.2.1 (ඇ) මාර්ගෝපදේශය පරිදි සුදුසකම් ලත් උනන්දුවක් දක්වන පාර්ශවයන්ට ප්‍රසම්පාදනයට සහභාගී වීම සඳහා අවස්ථා ලබා දිය යුතු වුවත්, මිල ගණන් කැඳවීමකින් තොරව පුද්ගලික ආයතනයකින් ඍජුවම අදාල මෘදුකාංග මිලදී ගැනීමට කටයුතු කර තිබුණි.

(ii) 9.7.2 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි පිලිපැදිය යුතු විශේෂිත මාර්ගෝපදේශ සංකීර්ණ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනයේදී පිළිපැද නොතිබුණි.

(iii) 2013 වර්ෂයේ රු.මිලියන 1.89 ක් වැයකර මිලදී ගත් මෘදුකාංගය හැර අනෙකුත් මෘදුකාංග මිලදීගැනීවලදී 2.8.1 ප්‍රසම්පාදන මාර්ගෝපදේශය පරිදි තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කර නොතිබුණු අතර, මෘදුකාංග සම්බන්ධයෙන් බාහිර විශේෂඥ උපදෙස් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. තවද, ප්‍රවර්තන වර්ෂය වනවිට වාර්ෂික අලුත් කිරීම හා නඩත්තු වියදම රු. මිලියන 4.73 ක් විය. ප්‍රසම්පාදන තීරණ ගැනීමේ දී මෙම නඩත්තු වියදම සළකා බලා නොතිබුණ අතර, ඉදිරි වර්ෂයන් සඳහා ද මෙම පිරිවැයන් දැරිය යුතු වේ.

(ආ) ප්‍රවර්තන වර්ෂයේ ප්‍රතිපාදන උපයෝගී කරගෙන මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සහ කතරගම සංචාරක නිවාසයට අලුතින් කොටසක් එකතු කිරීමේ ඉදිකිරීම් කොන්ත්‍රාත් සිදු කර තිබුණු අතර, මේ සඳහා එකතුව රු.මිලියන 26.8 ක් වැයකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත කරුණු අනාවරණය කෙරේ.

(i) මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීමේදී වැඩ අයිතම අංක 05 සඳහා කොන්ත්‍රාත්කරු කළ වැඩ ප්‍රමාණය ඉක්මවා රු.482,864 ක් ගෙවා තිබුණු අතර, විගණනයෙන් පෙන්වා දුන් පසුව එය රැඳවුම් මුදල්වලින් අයකරගෙන තිබුණි.

(ii) කතරගම සංචාරක නිවාසය ඉදිකිරීමේදී Tie Beam දැමීම සඳහා වලවල් කැපීම කොන්ක්‍රීට් සහ කම්බි වෙනුවෙන් සහ Aluminum Lovers Area වර්ග අඩි 18 ක් යන නොකල වැඩ සඳහා රු.243,524 ක් ගෙවා තිබුණු අතර, අයිතම 16 ක් සඳහා කල වැඩ ප්‍රමාණය ඉක්මවා රු.677,721 ක් ගෙවා තිබුණි. තවද Slab Beam (18”x9”) සඳහා දික් අඩි 98 කට රු.51,636 බැගින් දෙවරක් ගෙවා තිබුණි.

(iii) මාතර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය ඉදිකිරීමේ දී පළමු සැලැස්ම අනුව ගොඩනැගිල්ල අඩි 03 ක් එසවීමේදී ඉදිකල යුතු පඩිපෙලක අත්තිවාරම දැමීම සඳහා

රු.95,080 ක් වැයකර තිබුණු අතර, පසුව ගොඩනැගිල්ල අඩි 03 ක් එසවීමට ගත් තීරණය වෙනස් කිරීම නිසා මෙය නිෂ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණි.

(iv) මිල සැදහුම් ක්‍රමය මත ලංසුකරුවන් තෝරා ගැනීමේදී 2011 පෙබරවාරි 15 දිනැති අංක 488(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදයේ පරිදි රේන්බෝ පේජර්ස් නාමාවලිය හා වෙබ් අඩවිය උපයෝගී කරගත යුතු වුවත්, කතරගම සංචාරක නිවාසය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේදී ඒ අනුව කටයුතු කර නොතිබුණි. පූර්ව ලංසු රැස්වීම් නොපැවැත්වීම හා ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගීවිය හැකි බවට ලංසුකරුවන් දැනුවත් නොකිරීමත් ලංසු විවෘත කරන අවස්ථාවේදී තෝරාගත් කොන්ත්‍රාත්කරු පමණක් පැමිණ සිටීමත් නිසා විනිවිදභාවයකින් තොරව ලංසු විවෘත කිරීම වැනි තත්ත්වයන්ද පැවතුණි. අනුකූලතා සහතිකය ලබා ගැනීමකින් තොරව ගොඩනැගිල්ල පරිහරණයට ගෙන තිබුණි.

**2.8 කාර්යභාරයන් ඉටු කිරීම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරීම.**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂ 05 ක කාලය තුල දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳව තොරතුරු හා ඒ පිළිබඳව විගණන නිරීක්ෂණ පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2013 | පුනරාවර්තන | 1945.81 | 1877.70 | 68.11 | 3.50 |
| | මූලධන | 137.30 | 113.77 | 23.53 | 17.14 |
| | **එකතුව** | **2083.11** | **1991.47** | **91.64** | **4.40** |
| 2014 | පුනරාවර්තන | 2363.77 | 2355.19 | 8.58 | 0.36 |
| | මූලධන | 147.90 | 122.50 | 25.40 | 17.17 |
| | **එකතුව** | **2511.67** | **2477.69** | **33.98** | **1.35** |
| 2015 | පුනරාවර්තන | 3026.04 | 2966.92 | 59.12 | 1.95 |
| | මූලධන | 241.30 | 231.70 | 9.60 | 3.98 |
| | **එකතුව** | **3267.34** | **3198.62** | **68.72** | **2.10** |
| 2016 | පුනරාවර්තන | 3360.19 | 3326.86 | 33.33 | 0.99 |
| | මූලධන | 247.66 | 202.00 | 45.66 | 18.44 |
| | **එකතුව** | **3607.85** | **3528.86** | **78.99** | **2.19** |
| 2017 | පුනරාවර්තන | 3695.26 | 3377.73 | 317.53 | 8.59 |
| | මූලධන | 222.40 | 136.86 | 85.54 | 38.46 |
| | **එකතුව** | **3917.66** | **3514.60** | **403.07** | **10.29** |

සමාලෝචිත වර්ෂය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**අධි ප්‍රතිපාදන සලසා තිබීම**

-----------------------------

වැය විෂයයන් 32 ක් සඳහා එකතුව රු.මිලියන 1,709.55 ක අධිප්‍රතිපාදන සලසා තිබුණු අතර, එම ප්‍රතිපාදනවලින් රු.මිලියන 1,348.97 ක් පමණක් උපයෝජනය කිරීම නිසා ඉතිරිය වූ රු.මිලියන 360.58 සලසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 7 ක සිට සියයට 74 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 2.9 වෙනත් අමාත්‍යාංශ විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

-----------------------------------------------------------------

ඉඩම් අමාත්‍යාංශය විසින් ඉඩම් බැංකු වැඩසටහන හා බිම්සවිය වැඩසටහන සඳහා එකතුව රු.මිලියන 220 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසන් වනවිට ඉන් එකතුව රු.මිලියන 198.43 පමණක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 21.57 ක් හෙවත් සියයට 9.8 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණු අතර, මෙම වැඩසටහන් පිළිබඳව සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිවේගී Optical Cable වලින් මිනින්දෝරු දෙපාර්තමේන්තුව රැහැන්ගත කිරීම සඳහා රු.මිලියන 23.05 ක් වැයකර තිබුණු අතර, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.7 මාර්ගෝපදේශය පරිදි තොරතුරු පද්ධති ප්‍රසම්පාදනයේදී ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනය විමසා විශේෂ ලංසු කැඳවීමේ ලේඛන භාවිතාකර නොතිබුණු අතර, මුළු පිරිවැය ඇස්තමේන්තුවක් ද පිළියෙල කර නොතිබුණි.

(ආ) රු.මිලියන 9.78 ක් වැය කර ලැප්ටොප් පරිගණක 100 ක් මිලදී ගෙන තිබුණු අතර, පිරිවිතර ලේඛන පිළියෙල කිරීමේ දුර්වලතා හේතුවෙන් Spil- Resistant Keyboard සහිත පරිගණක මිලදී ගැනීමට අපේක්ෂා කර තිබුණද එම පහසුකම සහිත පරිගණක ලබා ගෙන නොතිබුණි. කාල සටහනක් අනුව ප්‍රසම්පාදන කටයුතු සිදු නොකිරීම නිසා මිලදී ගැනීමේ කටයුතු මාස හයක් ප්‍රමාද වී තිබුණු අතර, එකඟ වූ මාදිලියෙන් පරිගණක සපයාගෙන නොතිබුණි.

(ඇ) රු.මිලියන 6 ක වියදමින් පැරණි පිඹුරු පරිලේඛනගත කිරීම හා දත්ත පද්ධතියට එක් කිරීමට කටයුතු කර තිබුණු අතර, ලක්ෂ පහක පමණ පිඹුරු දත්ත පද්ධතියට එක් කර තිබුණත්, සංරක්ෂණය කල යුතු සියළු පැරණි පිඹුරු, දත්ත පද්ධතියට කඩිනමින් ඇතුලත් කිරීම සඳහා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කල හැකි වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි.

(ඈ) බිම් සවිය වැඩසටහන යටතේ ලබා දුන් රු.මිලියන 103.56 ක ප්‍රතිපාදන අදාළ වැඩසටහනෙන් බැහැරව දෙපාර්තමේන්තුවේ සාමාන්‍ය වියදම් සඳහා වැයකර තිබුණු අතර 2008 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා බිම් සවිය වැඩසටහනේ සමස්ත ප්‍රගතිය සියයට 12 ක්ව පැවතියද මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා දිරිදීමනා වශයෙන් රු.මිලියන 400 ක් ගෙවා තිබුණි.

**2.10 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28801 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 166.00 | 163.32 | 110.00 | 121.52 | 400.00 | 375.51 |

අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,758,974 ක් වූ අතර, ඒවා වර්ෂ 01 සිට වර්ෂ 35 ක දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**2.11 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2017 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 14.81 ක් විය. ඉන් වර්ෂ 02 ඉක්මවූ එකතුව රු.මිලියන 3.2 ක් වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**2.12 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් විදුලි උපකරණ පිළිබඳ ලේඛනයක් හා ප්‍රසම්පාදන කමිටු සඳහා පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණු අතර, මුදල් කටයුතුභාර නිළධාරීන් වෙනුවෙන් ඇප ලේඛනයක්ද පවත්වා නොතිබුණි.

**2.13 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්**

නිළධාරීන් සඳහා වෙන් කල වාහන 22 ක් හා සංචිත වාහන 265 ක් සඳහා මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.14 මානව සම්පත් කළමනාකරණය**

**2.14.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය හා පුරප්පාඩු කාර්යමණ්ඩලය පිළිබඳව විස්තර පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1139 | 965 | 174 |
| (ii) | තෘතියික මට්ටම | 83 | 55 | 28 |
| (iii) | ද්විතියික මට්ටම | 1340 | 957 | 383 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4896 | 4006 | 890 |
| | **එකතුව** | **7458** | **5983** | **1475** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) අවිධිමත්ව වෙනත් පාර්ශවයන්ට නිදහස්කල මානව සම්පත්**

**----------------------------------------------------------------**

ශ්‍රී ලංකා මිනින්දෝරු සේවයේ නිළධාරීන් පහලොස්දෙනෙකු, මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් තිදෙනෙකු හා දුරස්ත ග්‍රහන ශිල්පියකු ආරක්ෂක අමාත්‍යාංශයට සහ විදුලිබල අමාත්‍යාංශයට අවිධිමත් ලෙස මුදාහැර තිබුණි.

**(ආ) කාර්ය මණ්ඩල පුහුණු කිරීම**

**-----------------------------**

දෙපාර්තමේන්තුවේ නිළධාරින්, සේවකයන් 2302 ක් සඳහා ප්‍රවර්ථන වර්ෂය තුල පුහුණුවක් ලබා නොතිබුණි.

**(ඇ) නියමිත රාජකාරියෙන් බැහැරව සේවයේ යෙදවීම**

**--------------------------------------------------**

මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් 54 දෙනෙකු ප්‍රධාන කාර්යාලයේ කාර්යාල කාර්යය සහායකවරුන්, රියදුරන් සහ මුරකරුවන් ලෙස අනුයුක්ත කර තිබුණි.

**2.15 මුදල් පාලනය සම්බන්ධයෙන් කාර්යයන් පවරා දීම**

**------------------------------------------------------**

මු.රෙ. 135 ප්‍රකාරව ගණන්දීමේ නිලධාරියා විසින් මූල්‍ය බලතල පවරා දී තිබුණද බලතල පැවරෙන ඒ ඒ නිළධාරියාට පවරන කාර්යයන් දැක්වෙන ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.

**2.16 රජයේ නිලධාරින්ට ඇප තැබීම**

**--------------------------------**

දෙපාර්තමේන්තුවේ මුදල් භාර සරප් නිළධාරින් 37 ක් සඳහා මු.රෙ.880 ප්‍රකාරව ඇප තබා නොතිබුණි.